# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 536/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 27/03/2024 පැය 1455

**මාධ්‍ය නිවේදනය**

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 07 දෙනෙකු සහ තවත් සැකකරුවන් 19 දෙනෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ, ගාල්ල අපරාධ, කොළඹ අපරාධ හා බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාස.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම මෙහෙයුමට සම්බන්ධ කොළඹ අපරාධ කොට්ඨාසය, ගාල්ල අපරාධ කොට්ඨාස හා බස්නාහිර පළාත් උතුර කොට්ඨාසය හා කළුතර අපරාධ කොට්ඨාසයේ විශේෂ පොලිස් කණ්ඩායම් විසින් පහත වැටලීම් සිදු කර ඇත.

- 2024.03.26 වන දින සවස් කාලයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත කෙසෙල්වත්ත පොලිස් වසමේ ඩයස් පෙදෙස ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලිග්‍රෑම් 200 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

- 2024.03.26 වන දින සවස් කාලයේදී ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත අම්බලන්ගොඩ පොලිස් වසමේ ආඳාදොල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 100 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන වතුගෙදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

- 2024.03.26 වන දින දහවල් කාලයේදී ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත කොස්ගොඩ පොලිස් වසමේ කොස්ගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු **යුද හමුදා නිල ඇඳුම් කොටස් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන්** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන කොස්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

- 2024.03.26 වන දින සවස් කාලයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත අඟුලාන පොලිස් වසමේ අඟුලාන ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු **ගංජා ග්‍රෑම් 05 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

- 2024.03.26 වන දින සවස් කාලයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත දොඩන්ගොඩ පොලිස් වසමේ කිවුලවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු **ගංජා ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 200 ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන දොඩන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

- 2024.03.26 වන දින සවස් කාලයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත ගල්කිස්ස පොලිස් වසමේ ගල්කිස්ස ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු, සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 වන සොයිසාපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

- 2024.03.26 වන දින දහවල් කාලයේදී බස්නාහිර පළාත් උතුර කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත රාගම පොලිස් වසමේ රාගම ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 560 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

  **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තවද, මෙම විශේෂ මෙහෙයුමේ නිරත නිලධාරීන් විසින් ඉහත සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් අත්අඩංගුවට ගැනීමට අමතරව මෙම මෙහෙයුමේදී තවත් සැකකරුවන් 19 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.
අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය, ගාල්ල අපරාධ කොට්ඨාසය බස්නාහිර පළාත් උතුර කොට්ඨාසය සහ කළුතර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**